**ධීවර විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය - 2016**

---

ධීවර විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමයේ 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1990 අංක 23 දරන ධීවර විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය පනතේ 28(4) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

---

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් අවදානම් තක්සේරුකිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම්කිරීම පිණිස යෝජනා ක්‍රමයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළවන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් යෝජනා ක්‍රමයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

# 2. මූල්‍ය ප්‍රකාශන

## 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට ධීවර විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.2.1 විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයේ අඛණ්ඩ පැවැත්ම

විශ්‍රාම වැටුප් වගකීම වෙනුවෙන් ආදායමට අයකර තිබූ වෙන්කිරීම රු.3,030,671,474 ක් වූ අතර එය ඉකුත් වර්ෂයට වඩා සියයට 8.85 ක වැඩි වීමකි. එහි ප්‍රතිඵලයක් ලෙස 2016 දෙසැම්බර් 31 දිනට යෝජනා ක්‍රමයේ සෘණාත්මක ශුද්ධ වත්කම් තත්ත්වය රු.2,394,357,348 ක් දක්වා වැඩි වී තිබුණි. ඒ අනුව ඉදිරි වර්ෂයන් සඳහා ද මෙම තත්ත්වයන් තව දුරටත් වැඩිවිය හැකි බැවින් එය යෝජනා ක්‍රමයේ අඛණ්ඩ පැවැත්ම කෙරෙහි අහිතකර ලෙස බලපානු ලැබේ.

### 2.2.2 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති

පහත සඳහන් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

**(අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 01**

ගොවි විශ්‍රාම වැටුප් අංශයට ලබා දී ඇති රු.649,510,627 ක්වූ ණයද කෘෂි රක්ෂණ මණ්ඩලයෙන් ලබාගෙන ඇති රු.21,842,502 ක්වූ ණයද මාස 12 ක් තුළ නොපියවන නමුත් ජංගම වත්කම් හා වගකීම් ලෙස ඉදිරිපත් කර තිබුණි.

**(ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 37**

සක්‍රිය දායකයන් හා ධීවර විශ්‍රාමිකයන්ගේ විශ්‍රාම වැටුප් වගකීම සඳහා ආයු ගණක තක්සේරුව කාලානුරූපීව සිදු කළ යුතු වුවද 2007 වර්ෂයෙන් පසුව එය සිදුකර නොතිබුණි. එම නිසා 2007 වර්ෂයේදී සක්‍රිය දායකයන් හා විශ්‍රාමලාභීන් සංඛ්‍යාව සියයට 39 කින් අඩුවී තිබූ නමුත් එම කාලයට අදාළ ප්‍රතිපාදනය සියයට 144 කින් වැඩිවී තිබුණි. ඒ අනුව විශ්‍රාම වැටුප් වගකීම සඳහා වෙන්කිරීමේ දී ඒ සඳහා සැලකිය යුතු බලපෑමක් කළ හැකි පොළී අනුපාතය, බඳවා ගැනීම්, ඉවත්වීම්, මරණ, අබලතාවයන් වැනි මූලික සංරචකයන් සහ සක්‍රිය දායකයන්ගේ සහ ධීවර විශ්‍රාමිකයන්ගේ වෙනස්වීම් කෙරෙහි සැලකිල්ලක් දක්වා නොතිබුණි.

**2.2.3 විගණනය සඳහා සාක්ෂි නොවීම.**

-------------------------------------

ධීවර විශ්‍රාම වැටුප් අරමුදලෙන් ගොවි විශ්‍රාම වැටුප් අරමුදලට ලබා දී ඇති රු.649,510,627 ක ණය සඳහා එම මුදල් පියවීම් හා පොලී අයකිරීම් පිළබඳව කොන්දේසි ඇතුළත් ගිවිසුම් පිටපත් විගණනයට ඉදිරිපත් නොවුණි.

**2.3 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්**

----------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) එකතුව රු. 1,267,697 ක් වූ ගෙවිය යුතු විගණන ගාස්තු නිරවුල් කිරීමකින් තොරව වර්ෂ ගණනාවක සිට ඉදිරියට ගෙන එමින් පැවතුණි.

(ආ) 2007 වර්ෂයේ සිට අවස්ථා කිහිපයක දී ගොවි විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය සඳහා ලබා දී තිබූ ණය මුදලින් 2016 දෙසැම්බර් 31 දිනට රු.649,510,627 ක (ණය සහ පොලිය) ශේෂයක් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරියට ගෙනැවිත් තිබූ අතර මෙම ණය අයකර ගැනීමේ ප්‍රගතිය ඉතා දුර්වල මට්ටමක පැවතුණි.

**2.4 නීති රීති , රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

--------------------------------------------------------------------------------

පහත සඳහන් අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

| **නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව** | **අනුකූල නොවීම** |
| --- | --- |
| 1990 අංක 23 දරන ධීවර විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රම පනත | |
| (අ) 16 වන වගන්තිය | පනතේ විධිවිධාන ප්‍රකාරව සාමාජික ගාස්තු ගෙවීම පැහැරහරින ලද සාමාජිකයන්ගේ සාමාජිකත්වය අවලංගු කිරීම සම්බන්ධයෙන් අදාළ සාමාජිකයන් දැනුවත් කිරීමට කටයුතු කර නොතිබුණු අතර එම හේතුවෙන් අවලංගු වූ සහතිකයක් නැවත වලංගු කරවා ගැනීමට දායකයෙකුට ඇති අයිතිය ද අහිමි වී තිබුණි. |
| (ආ) 20 වන වගන්තිය | උපදේශක කමිටුව සාමාජිකයන් 12 දෙනෙකුගෙන් සමන්විත විය යුතු වුවද 2016 වර්ෂය වෙනුවෙන් එම කමිටුව සඳහා සාමාජිකයන් 09 දෙනෙකු පමණක් පත්කර තිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

---

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

---

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය සඳහා යෝජනා ක්‍රමයේ මෙහෙයුම් කටයුතුවලින් රු.2,420,592 ක අතිරික්තයක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.15,147,293 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ රු. 17,567,885 ක එනම්, සියයට 116 ක මූල්‍ය ප්‍රතිඵලයේ වර්ධනයක් නිරීක්ෂණය විය. සමාලෝචිත වර්ෂයේදී පොළී ආදායම රු. 25,005,931 කින් වැඩි වීම මූල්‍ය ප්‍රතිඵලයේ මෙම වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

### 3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

---

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය සඳහා යෝජනා ක්‍රමයට මුළු දායකය ඉක්මවා විශ්‍රාම වැටුප් ගෙවීම් රු.52,892,968 ක් එනම් සියයට 5,697 ක් විය. ඉකුත් වර්ෂය හා සැසඳීමේ දී සමාලෝචිත වර්ෂයේ ධීවරයින්ගේ දායක මුදල් සියයට 10 කින් අඩු වී ඇති අතර මුළු විශ්‍රාම වැටුප් ගෙවීම් සියයට 14 කින් ද විශ්‍රාම වැටුප් වගකීම සියයට 8.9 කින් ද වැඩි වී තිබුණි.

(ආ) යෝජනා ක්‍රමයට දී තිබූ ණය මත ලැබිය යුතු පොලී රු.61,188,373 ක් වූ අතර එය මුළු පොලී ආදායමින් සියයට 97 ක් විය. භාණ්ඩාගාර බිල්පත් පොලී ආදායම සියයට 03 ක් පමණක් විය.

## 4. මෙහෙයුම් සමාලෝචනය

---

### 4.1 කළමනාකරණ ක්‍රියාකාරකම්

---

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මාසිකව තැපැල් කාර්යාල වෙත යවන විශ්‍රාම වැටුප් වලින් නොගෙවූ ප්‍රමාණය කාල සීමාව ඉක්ම ගිය පසු හැකිතාක් ඉක්මණින් එම කාර්යාල වෙතින් ගෙන්වා ගත යුතු වුවද මණ්ඩලය විසින් එසේ කටයුතු කර නොතිබුණි.

(ආ) දායකයින් පිළිබඳ ජීව දත්ත වාර්තා යාවත්කාලීනව පවත්වාගෙන නොයාම හේතුවෙන් මාසික විශ්‍රාම වැටුප් ගෙවීමේ ලේඛනයන්හි මිය ගිය පුද්ගලයන්ගේ නම් ඇතුළත් වී තිබුණි. ඒ හේතුවෙන් මාසික විශ්‍රාම වැටුප් ගෙවීම් අවස්ථාවල දී හිතාමතා හෝ නොසැලකිලිමත් කමින් හෝ වැරදි හා වංචා සිදුවීමට ඉඩකඩ පැවතුණි.

(ඇ) 2016 නොවැම්බර් 30 දින උපදේශක කාරක සභා රැස්වීම් වාර්තාවේ සඳහන් කර තිබුණේ සමාලෝචිත වර්ෂයේ ඔක්තෝබර් දක්වා ධීවරයින් බඳවා ගැනීම්, විශ්‍රාම වැටුප් ගෙවීම්, මරණ හා බෙලහීන පාරිතෝෂික හා අරමුදලේ ශේෂය පමණි. 2014 වර්ෂයේ සිට ධීවර විශ්‍රාම වැටුප් අරමුදල මූල්‍ය අර්බුදයකට ලඟා වෙමින් පවතින බව හඳුනාගෙන තිබුණද එම අර්බුදයට මුහුණ දීමට උපදේශක කාරක සභාවේ නිර්දේශ මොනවාද යන්න සහ ඒවා ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය ආදී කිසිවක් වාර්තාවේ සඳහන් කර නොතිබුණි.

(ඈ) ප්‍රතිලාභ අහිමි වූ දායකයෙකු විසින් එදිනෙන් පසු ගෙවන දායක මුදල් භාර නොගන්නා බවට දායකයෙකු වෙත නිකුත් කරනු ලබන සහතික ඔප්පුවෙහි කොන්දේසි හා වරප්‍රසාද යටතේ සහ වාරික ගෙවීම් සටහන් පොතෙහි උපදෙස් යටතේ සඳහන් කර තිබුණ ද ප්‍රතිලාභ අහිමි වූ දායකයින්ගෙන් එදිනෙන් පසුව ද වාරික මුදල් ආයතනය විසින් භාරගෙන තිබුණි. ඒ අනුව පනවා තිබුණු කොන්දේසිය ඉටු කිරීම සඳහා ප්‍රමාණවත් ක්‍රමවේදයක් ආයතනය තුළ ක්‍රියාත්මක වී නොතිබුණ අතර ආයතනය විසින්ම එකී කොන්දේසි කඩකිරීමක් ද සිදු වී තිබුණි.

## 4.2 කාර්යසාධනය

-----------------

ධීවරයින්ගේ මහලු වයසේ දී හෝ දුබලතාවයක දී ධීවරයන්ට සමාජ ආරක්ෂණය සැලසීම, ධීවරයකු මියගිය විට එම ධීවරයාගේ යැපෙන්නන්ට සහන සැලසීම, තම ජීවනෝපායෙහි දිගටම නියැලීම සඳහා ධීවරයන් උනන්දු කරවීම, තරුණ අය ධීවර කර්මාන්තය වෙත යොමු කරවීම, ධීවරයන් අතර ඉතිරි කිරීමේ පුරුද්ද ඇති කිරීම සහ සකසුරුවම්කම වැඩි දියුණු කිරීම යන පරමාර්ථ ඉටු කිරීම පිණිස ධීවර විශ්‍රාම වැටුප් සහ සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය ස්ථාපිත කර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2014 වර්ෂයෙන් පසු අරමුදල ක්ෂය වන තත්ත්වයක් ආරම්භ වී 2020 දී එය ශූන්‍ය වන බවත් ප්‍රතිසංවිධානයන් කළ යුතු බවත් 2014 – 2016 සංයුක්ත සැලැස්ම පිළියෙල කිරීමේ දී හඳුනාගෙන වර්ෂ 03 ක් ඉක්ම ගොස් තිබුණද කිසිදු ප්‍රතිසංවිධාන කටයුත්තක් සිදු කිරීමට ආයතනය අපොහොසත් වී තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කළ යුතු වුවද පිළියෙල කර තිබුණේ ධීවරයන් බඳවා ගැනීම හා දායක මුදල් අයකර ගැනීම පමණි. අරමුදල තුළ අර්බුදකාරී තත්ත්වයක් ඇතිවෙමින් තිබියදීත් ඇතිවිය හැකි තත්ත්වයට මුහුණ දීමට හා ශක්තීන් , දුර්වලතා හඳුනා ගෙන යෝජනා ක්‍රමය වැඩිදියුණු කිරීමට සැලැස්මක් සකස් කර නොතිබුණි.

(ඇ) තම ජීවනෝපායෙහි දිගට ම නියැලීම සඳහා ධීවරයන් උනන්දු කරවීම, තරුණ අය ධීවර කර්මාන්තය වෙත යොමු කරවීම, ධීවරයන් අතර ඉතිරි කිරීමේ පුරුද්ද ඇති කිරීම සහ සකසුරුවම්කම වැඩි දියුණු කිරීම යන පරමාර්ථ ඉටු කිරීම සම්බන්ධයෙන් යෝජනා ක්‍රමයේ අවධානය යොමු වී නොතිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂය තුළ දායකයින්ගෙන් රු.3,275,000 ක දායක මුදල් ලබා ගැනීමට අපේක්ෂා කර තිබුණද, ලැබුණු තථ්‍ය දායක මුදල රු.928,732 ක් විය.

(ඉ) අයවැය ඇස්තමේන්තු අනුව සමාලෝචිත වර්ෂය තුළදී යෝජනා ක්‍රමයට නව දායකයින් 150 ක් බඳවා ගැනීමට ඇස්තමේන්තු කළ ද දායකයින් 86 දෙනෙක් පමණක් බඳවා ගෙන තිබුණි. එය 2012 වර්ෂයට සාපේක්ෂව සියයට 86 ක අඩු වීමකි. එසේම සමාලෝචිත වර්ෂය තුළදී දායකයින් 109 දෙනෙකු යෝජනා ක්‍රමයෙන් ඉවත් වී තිබුණි. මෙම තත්ත්වය අරමුදලේ අඛණ්ඩ පැවැත්මට අහිතකර ලෙස බලපා තිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂය සඳහා යෝජනා ක්‍රමයට මුළු දායකය රු.1,251,221 ක් වුවද මුළු විශ්‍රාම වැටුප් ගෙවීම රු.50,320,018 ක්ද ශුද්ධ වාරික ගෙවීම් රු.1,655,836 ක් හා මරණ හා බෙලහීන ප්‍රතිලාභ ගෙවීම් රු.441,000 ක්ද වූ බැවින් ලැබුණු දායකය ඉක්මවා අරමුදලෙන් රු.51,165,633 ක ගෙවීම් කර තිබුණි.

(උ) දායක ප්‍රතිලාභ ගෙවීම ප්‍රමාද වීම, ධීවරයින් යෝජනා ක්‍රමයෙන් අපේක්ෂා කළ ප්‍රතිලාභ අනපේක්ෂිතව අහිමි වීම, දායකයින් පිළිබඳ තොරතුරු යාවත්කාලීන නොවීම සහ බඳවා ගැනීම ක්‍රමයෙන් හීන වීම තුලින් කර්මාන්තය තුළට යොමු කරවීමේ අඩු ප්‍රවණතාව හා ඉතිරි කිරීමේ පුරුද්ද අහිමි වී යාම වැනි කරුණු අනුව ධීවර විශ්‍රාම වැටුප් සහ සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමයෙන් ධීවර ජනතාවට ලබා දිය යුතු සේවාව කාර්යක්ෂමව, ඵලදායීව හා අපේක්ෂා කළ පරිදි ඉටුනොවීමේ තත්ත්වයක් ඇතිවී තිබුණි.

## 5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

------------------------------------

### 5.1 අයවැය ලේඛනමය පාලනය

------------------------------

අයවැයගත සහ තථ්‍ය ආදායම හා වියදම අතර සියයට 30 සිට සියයට 133 දක්වා සැලකිය යුතු විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදා ගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

## 6. පද්ධති හා පාලනයන්

-----------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලයේ සභාපතිගේ අවධානයට වරින්වර යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුය.

| පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|
| අ) නොගෙවූ විශ්‍රාම වැටුප් | නොගෙවූ විශ්‍රාම වැටුප් කාලීනව නැවත ගෙන්වා නොගැනීම. |
| ආ) කළමනාකරණ තොරතුරු පද්ධතිය | පද්ධතිය යාවත්කාලීන නොකිරීම නිසා කළමනාකරණයට අවශ්‍ය වාර්තා ලබා ගැනීමට නොහැකිවීම. |